# 1 අර්ථ කථාවන්හි පැමිණි ත්‍රිලක්ෂණ වචනාර්ථ

සියලු ලෝක සත්ත්වයා කෙරෙහි පතල මහා කරුණා ඇති තථාගත ශාන්තිනායකයාණන් වහන්සේ දහම් බෙර වයා ලෝ සත සනහා නිවන්පුර මංපෙත් විවරකර දී සියළු දුකින් මුදවා සියළු සංස්කාරයන්ගේ වැනසී යන ස්වභාවය ලෝ දනට පසක් කරවමින් අනුපාදිශේෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවන් වැඩිසේක. ඒ ආජානෙය්‍ය මනුෂරත්නයාගේ ඖරස පුත්‍ර වූ මහා කාශ්‍යප මහරහතන්වහන්සේ ප්‍රමුඛ පන්සියයක් වූ සිව්පිළිසිඹියා පත් මහරහතන්වහන්සේලා ස්වකීය පීතෘන් වහන්සේගේ ඒ ධර්මචක්‍රය වැනසී නොයනු පිණිස සංගායනාවට නංවා පිරිනිවන් වැඩියහ.

ඉන් අනතුරුව ඒ ශ්‍රේෂ්ඨ ශාසන පරම්පරාවෙන් පැමිණි මේ ධර්මමාණික්‍ය රත්නය සබ්බකාමී සංඝ ශ්‍රේෂ්ඨයන්වහන්සේ ප්‍රමුඛ ඒ සුගතතථාගතයන්ගේම ධර්ම ලෙයින් ජාත වූ සත්සියයක් සිව්පිළිසිඹියාපත් මහරහතන්වහන්සේලා මැනවින් ඔපදමා බබුලුවා තබා තමන්වහන්සේලා ද පිරිනිවන් වැඩියාහුය.

එසේ බැබලූ ධර්මරත්නයේ රශ්මිධාරා වියැකෙන්නට නොදී මොග්ගලීපුත්තතිස්ස මහාසංඝරාජයාණෝ ප්‍රමුඛ සිව්පිළිසිඹියාපත් මහරහතන්වහන්සේලා දහස්නමක් එක්ව නැවතත් මෙරමුදුන සුදිලෙන සූර්ය මණ්ඩලය සේ බබලවා, ඒ රශ්මි මණ්ඩලයෙන් තව තවත් ලෝදන සැනහේවා යයි සිතා සිව් දිග දහම් බලසෙන් යවා බුද්ධරාජ්‍ය පුළුල් කොට වදාළාහුය. එගමන මෙසිරිලක වැඩි ඒ අනුබුද්ධ මහාමහේන්ද්‍ර මහාරහතන් වහන්සේ ප්‍රමුඛ ධර්ම දූතයෝ ඒ බුද්ධ ශ්‍රේෂ්ඨයන්වහන්සේගේ දහම් බෙරය ලක් පොළොව මත වයා වදාළාහුය. නොයෙක් වර සිරිලක්මහී තොමෝ සාධු ප්‍රීති ඝෝෂාවෙන් කම්පනය වෙමින් ඒ බුදුසසුන මේ මහපොළොවට භාරගත්තීය.

එතැන් පටන් වසර දෙදහස් තුන්සියයකට අධික කාලයක් ඒ මහාමහේන්ද්‍ර සඟරරජුන් පිහිටවූ ලක්දිව බුදුසසුන මහාඅරිට්ඨ ආදී මේ ධරණීතලයෙහි ජාත වූ මහාරහතන් වහන්සේලා විසින් රැගෙන අවුත් අද දක්වා ශේෂව පවතින්නේය.

සර්පවෙදකම නම් පරම්පරානුයාතව පැමිණියවුන් සන්තකයෙහිම මනාව පවතින්නේය. මන්ද යත් ඉපැරණි සර්ප වෙද්දු එහි මන්ත්‍ර ආදියත් ඖෂධ ආදියත් ඒවා මිශ්‍රකරන ක්‍රමවේදයත් මැනවින් දරාගෙන විත් මතුපරපුරට ලබාදුන් හෙයිනි. ඉදින් සර්ප වෙදකමින් අර්ථ ඇත්තා වූ යම් පුරුෂයෙක් සර්ප වෙදකම ඉගෙනීමට යා යුත්තේ ඒ වෙදපරපුරේ අද සිටින වෙදෙකු වෙතටය. එමෙන්ම ඒ බුද්ධ ශ්‍රේෂ්ඨයන්වහන්සේගේ ශාසනයේ යම්ම කරුණක් උකහා ගැනීමට කැමති නුවණැති කුලපුත්‍රයෝත් සෙවිය යුත්තේ ද ඒ පරපුරේම ජාත වූවෙක් ය. නොහොත් ඒ ඉපැරණි මහාවිහාරීය ථේරපරම්පරාවේ ආචාර්යවාද පිරිනොහෙලමින් දහම් අරුත් බහා තබා ඇති මිණිමංජුසාවන් බඳුවූ පෙළ අර්ථකථා ටීකා සංඛ්‍යාත ත්‍රිපිටක බුද්ධ වචනය තුළය.

අනිත්‍ය දුක්ඛ අනාත්ම යන මේ ත්‍රිලක්ෂණ ධර්මයෝ වනාහි සංස්කාරයන්ගේ යථාභූතස්වභාවය ගෙනහැර දක්වා සසර දුකින් එතරවනු රිසියන්ට තුන්ලෝක ධාතුවෙහිම වූ සියළු සංස්කාරයන් කෙරෙහි කලකිරීම ඉපිදවීම පිණිස පෙනී සිටින ධර්මයෝ ය. මැනවින් සසරදුක් කෙළවර කරනු රිසි කුලපුත්‍රයන් විසින් මේ ත්‍රිලක්‍ෂණ ධර්මයෝ පිළිබඳව මනාව දතයුත්තාහ. එබැවින් එකී කුලපුතුන්ට සුවසේ ඒ අර්ථ වටහා ගැනීමට ත්‍රිපිටක පෙළ අටුවාවන්හි ආ ක්‍රමයෙන් ත්‍රිලක්‍ෂණ ධර්මයන්ගේ අර්ථ සැපයීමට මේ සටහන් පෙල තබන්නෙමු.

## ත්‍රිලක්‍ෂණයන්ගේ වචනාර්ථ

ත්‍රිලක්‍ෂණයන් යනු අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ලක්‍ෂණයන්ය. හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගත් සෑම ධර්මයක් ම ප්‍රධාන ලක්‍ෂණ දෙකකින් යුක්ත වේ.

1. පච්චත්ත ලක්ඛණ (පෞද්ගලික ලක්ෂණය)
2. සාමාන්‍ය ලක්ඛණ (පොදු ලක්ෂණය)

- මෙහි පච්චත්ත ලක්ෂණය යනු ලක්ඛණ, රස, පච්චුපට්ඨාන, පදට්ඨානාදී නයින් දේශිත ධාතුන්ගේ ලක්ෂණය, කෘත්‍ය හෙවත් රසය, වැටහෙන ආකාරය, එම ධර්මයට ආසන්න කාරණාව යන කරුණුය. උදාහරණ වශයෙන්,
    - පඨවිධාතුව
        - කක්ඛලත්ත ලක්ඛණා (කර්කශභාවය ලක්ෂණය යි)
        - පතිට්ඨාන රසා (අන් ධාතුන්ට පිහිටීමට ආධාර වන බව කෘත්‍ය රසය යි)
        - සම්පටිච්ඡන පච්චුපට්ඨානා (අන් ධාතූන් පිළිගන්නා බව වැටහෙන ආකාරය යි)
        - සෙසත්තය පදට්ඨානා (සෙසු ධාතු තුන එනම් ආපෝ තේජෝ වායෝ ආසන්න කාරණාව යි.)

    මේ ආකාරයට එකම ධාතුවේ විවිධ ගුණාංග දැක්වීම පච්චත්ත ලක්‍ෂණය වේ.

- මෙහි සාමාන්‍ය ලක්‍ෂණය යනු සියළුම සංඛත ධර්මයන්ගේ පොදු ලක්ෂණයි. ඒවා නම් ඉහත කියන ලද අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ලක්‍ෂණත්‍රය යි. එබැවින් භාග්‍යවතුන් වහන්සේ වදාළේමැයි,

I. ‘‘සබ්බෙ සඞ්ඛාරා අනිච්චා’ති - යදා පඤ්ඤාය පස්සති

අථ නිබ්බින්දති දුක්ඛෙ - එස මග්ගො විසුද්ධියා.’’

[සියලු සංස්කාරයෝ අනිත්‍යයහ යි යම් කලෙක විදසුන් නුවණින් දක්නේ ද එ කල්හි මේ (ස්කන්ධපරිහරණය යැයි කියන ලද) දුකෙහි (මුදුන් පත් වුට්ඨානගාමිනීවිපස්සනා වශයෙන්) කළකිරෙන්නේ ය. (එසේ කලකිරුණේ දුඃඛපරිඥානාදි විසින් සත්‍යප්‍රතිවෙධය කරන්නේ ය. එ හෙයින්) මේ සංස්කාරයන් කෙරෙහි නිර්වෙදය, නිර්මල වීමට (නොහොත් නිවනට) මඟ ය.]

II. ‘‘සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා’ති - යදා පඤ්ඤාය පස්සති

අථ නිබ්බින්දති දුක්ඛෙ - එස මග්ගො විසුද්ධියා.’’

[සියලු සංස්කාරයෝ (උදයව්‍යයයෙන් පෙළෙන හෙයින්) දුක්හ යි යම් කලෙක විදසුන් නුවණින් දකී ද, එකලැ මේ ස්කන්ධ පරිහරණයෙහි (දුකෙහි) කළකිරෙන්නේ ය. (එසේ කලකිරුණේ සත්‍යයන් පිළිවිදුනේ ය.) මේ සංස්කාරයන් කෙරෙහි කළකිරීම, නිර්මල බවට (නොහොත් නිවනට) මඟය (කාරණ ය).]

III. ‘‘සබ්බෙ ධම්මා අනත්තා’ති - යදා පඤ්ඤාය පස්සති

අථ නිබ්බින්දති දුක්ඛෙ - එස මග්ගො විසුද්ධියා.’’

[සියලු පස් කඳහු (තමා වසයෙහි නොපවත්නා හෙයින්) අනාත්මහ යි යම් කලෙක විදසුන් නුවණින් දක්නේ ද, එ කල්හි මේ දුකෙහි (ස්කන්ධපරිහරණයෙහි) කළකිරෙන්නේ ය. (එසේ කළකිරුනේ සත්‍යප්‍රතිවෙධය කරන්නේ ය.) එහෙයින් මේ සංස්කාරයන්හි කලකිරීම, නිර්මල බවට (නොහොත් නිවනට) මඟ ය. ( ධම්මපදපාළි මග්ග වග්ගය - බු.ජ.මු පි.94 )]

[මෙකී ත්‍රිලක්ෂණයන්ගේ පදගතාර්ථය අර්ථකථාවන්හි මෙසේ දැක්වේ.]

- **අනිත්‍ය ලක්ෂණය**

**“තං හි හුත්වා අභාවට්ඨෙන අනිච්චං, අනිච්චන්ති කතාය ආදිඅන්තවන්තතාය වා අනිච්චං”** (පටිසම්භිදාමග්ග අ.ක. - සම්මස්සන ඤාණනිද්දෙස වණ්ණනා - හේ.මු. 177)

“ඒ රූපාරූප ධර්මයෝ ඉපිද අභාවයට යන අරුතින් අනිච්චං ය. ඨිති ක්ෂණයට පැමිණියහුගේ අනිත්‍යතාව ඇති බැවින් හෝ උප්පාද වය සංඛ්‍යාත ආදියකින් අන්තයකින් යුක්ත බැවින් හෝ අනිච්චං ය.”

- **දුක්ඛ ලක්ෂණය**

**“දුක්ඛයතීති දුක්ඛං, යස්සුප්පජ්ජති තං දුක්ඛිතං කරෝතීති අත්ථෝ”** (පටිසම්භිදාමග්ග අ.ක. - අභිඤ්ඤෙය්‍යා නිද්දේසවණ්ණනා - හේ.මු. 55)

“දුක් කරවන්නේහු යි දුක්ඛං වේ. යමෙකුට උපදියි ද ඔහු දුක්ඛිතයෙකු කරයි යන අර්ථය යි.”

- **අනාත්ම ලක්ෂණය**

**“අත්තනි වසීකාරකො වෙදකො සයංවසීති එවං පරිකප්පිතස්ස අත්තසාරස්ස අභාවෙන අනත්තා”** (පටිසම්භිදාමග්ග අ.ක. - ලක්ඛණත්තික නිද්දෙසවණ්ණනා - හේ.මු. 99)

“තමා කෙරෙහි වූ වශීකාරකයෙක් විඳින්නෙක් මැඩපවත්වන්නෙක් ඇත්තේය යන මෙසේ වූ පරිකල්පිත ආත්මසාරයකගේ අභාවයෙන් අනත්තා නම් වේ.”

ත්‍රිලක්ෂණය පිළිබඳ ථේරවාදී අර්ථ කථාවන්හි මෙසේ සැකෙවින් දක්වා ඇති අර්ථය වඩාත් ගැඹුරින් ත්‍රිපිටකයෙහි විස්තර වේ.

**එහෙයින් ඒ ගම්භීර වූ විස්තරාත්මක අර්ථ වර්ණනාව යථා ශක්තියෙන් මීළඟ ලිපිවලින් විස්තර කරන්නෙමු.**